කථානායක, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
சபாநாயகர், இலங்கை பாராளுமன்றம்
*Speaker, Parliament of Sri Lanka*

## පාර්ලිමේන්තුවේ ගරු කථානායක
## කරු ජයසූරිය මැතිතුමාගේ පණිවුඩය

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ආයතනයට අදාල වෙබ් අඩවියක් ස්ථාපිත කරන මෙම මහඟු අවස්ථාවේ, සුබපැතුම් පල කිරීමට හැකිවීම සම්බන්ධයෙන් සතුටට පත්වෙමි. සියළු පුරවැසියන් මෙම කටයුත්ත මහත් සතුටින් පිළිගනු ඇත යනු මගේ විශ්වාසයයි.

රාජ්‍ය ආයතන හා ඒවායේ කටයුතු මගින්, සිදුකෙරෙන බාධාවන් මත, මහජනතාව ගැටළු වලට මුහුණ දෙනු දැකිය හැකිය. එලෙස විවිධ අන්දමින් අනුකම්පා විරහිත ලෙස රාජ්‍ය ආයතන මගින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් මත අසහනයට පත්වන මහජනතාවට සහනයක් පැතීම සඳහා ගත හැකි සරලම ක්‍රියා මාර්ගය, පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට පැමිණිලි කිරීමයි. මෙම ආයතනය බිහිව ඇත්තේ මහජනතාවට සිදුවන එබඳු හිංසනයන්ගෙන් ඔවුන් ආරක්ෂා කර ගැනීමටයි.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ධූරය (ඔම්බුඩ්ස්මන්) ස්ථාපනය කිරීම සඳහා 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන වගන්තියෙන් පාර්ලිමේන්තුවට බලය පවරා දෙනු ලැබ, එම ධූරය ස්ථාපනය කරමින් එහි බලතල, වගකීම් හා කාර්යයන් අර්ථ නිරූපනය කළ 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇත.

මෙම ක්‍රියාදාමය මහජනතාවට ලගාවීමට අපහසු දුෂ්කර කාර්යයක් වුයේ, සෑම අවස්ථාවකදීම පැමිණිල්ලක්, මහජන නියෝජිතයකු මගින් කථානායකවරයා වෙත යොමුකොට, ඉන්පසුව මහජන පෙත්සම් කාරක සභාවේ තීරණය මත ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු කිරීමේ දීර්ඝ ක්‍රියාදාමය නිසාය.

ඒ අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව හෝ වෙනත් අසාධාරණ ක්‍රියා සම්බන්ධයෙන් හෝ ජනතාව වෙතින් ඔම්බුඩ්ස්මන්වරයාට සෘජුව ලැබෙන චෝදනා හෝ පැමිණිලි, සලකා බැලීමෙහි ඔම්බුඩ්ස්මන්වරයාට 1994 අංක 26 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනතින් බලය පවරන ලදී. මෙමගින් අදාල සංකල්පයේ ප්‍රබල වෙනසක් සිදු වීම මත පැමිණිලි ගලා ඒම සීග්‍ර විය.

නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්හි ස්වාධීනත්වයේ ජනප්‍රිය ආරක්ෂකයෙකු ලෙස පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය පත්ව ඇත. පුද්ගලයාට රැකවරණය දෙමින් රජය මෙහෙය වීමේ අධිකාරියක් වන පාර්ලිමේන්තු කොමසාරිස් වරයාට ප්‍රජාතන්ත්‍රවාදය තුල වැදගත් භූමිකාවක් පැවරී තිබේ.

ලෝකයේ සෑම රටකම පාහේ පාර්ලිමේන්තු කොමසාරිස් සංකල්පය මනා ක්‍රියාකාරිත්වයෙන් ක්‍රියාශීලිව පවතී. එහි ස්වාධීන, නම්‍යශීලි හා විශ්වාසවනීය භාවය මත රාජ්‍ය පාලනයේදී මහජනයාගේ අයිතීනට සාධාරණ විසඳුම් ලබා දී සවි ගැන්වීමෙන්, අයහපත් පාලනය යහපත් බවට පත් කරගැනීමේ මාවතක් ලෙස, මෙම සංකල්පය රජය විසින් අවධාරණය කරනු ලැබ ඇත.

ඔම්බුඩ්ස්මන්වරයකුගේ රාජකාරිය සර්ව සාධාරණ හා දේශපාලනමය නොවූ සංකල්පයක් මත වන්නක් බැවින්, සමාජයේ සියලු ආර්ථික මට්ටම්වල තැනැත්තනට තම ගැටලු නිරාකරණය කර ගැන්ම සඳහා විශ්වාසවන්තව, බියෙන් තොරව, පක්ෂපාතීත්වයෙන් හා වියදමකින් තොරව ඉදිරිපත් වීමේ අවස්ථාව ලැබේ.

1994 අංක 26 දරණ සංශෝධනය මගින් ඉටු වූ බලාපොරොත්තු තවදුරටත් පෙරට ගෙනයමින්, නවීන තාක්ෂණය ද මහජනතාවට වඩා සමීප කර එමගින් ගත් තවත් දැවැන්ත පියවරක් ලෙස මෙම වෙබ් අඩවිය ස්ථාපනය කිරීම සැලකිය හැකිය.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය ස්ථාපිත කර වසර 35ක් ගත වන අවස්ථාවක, නව තාක්ෂණයට යොමු වෙමින් විනිවිදභාවයෙන් යුතු සාධාරණ සර්වග්‍රාහී තීරණගැනීමේ ක්‍රියාවලි තුලින් යහපාලනයක් ඇති කිරීමේ ප්‍රයත්නයට දායකවීම පිළිබඳ මාගේ සුභාශිංෂණ එකතු කරමි.

කරු ජයසූරිය
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක